**covid -19 සති පාසල සබරගමුව පළාත 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව**

**ඒකකය 02- ශ්‍රී ලංකාවේ භූ දර්ශනය**

**ක්‍රියාකාරකම 08-** ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි සිදු කරන බලපෑම

**හැදින්වීම-** ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි තීරණාත්මක ලෙස බලපාන අතර මෙම භූ දර්ශනය ප්‍රාදේශීයව වෙනස් වේ.එය වෙරළ බඩ කලාපය ,තෙත් කලාපය,වියළි කලාපය,කදුකර කලාපය හා යාපන අර්ධද්වීපය වශයෙන් බෙදා දැක්විය හැකිය.එම එක් එක් කලාප වල භූ දර්ශනයේ වෙනස්කම් අනුව මානුෂ භූ දර්ශනය ද වෙනස්වන බව මෙහිදී පැහැදිලි කරන අතර මේ සතියේ ක්‍රියාකිරකම මගින් ආවරණය වන්නේ වෙරළබඩ කලාපය,තෙත් කලාපය හා වියළි කලාපය යන ප්‍රදේශවල භෞතික භූ දර්ශනය මත වෙනස් වී ඇති මානුෂ භූ දර්ශනය පිළිබඳවයි.

**ගුණාත්මක යෙදවුම්**: 9 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව පෙළපොත, සටහන් පොත,පෑන්,පැන්සල්

**ක්‍රියාකාරකම සදහා සිසුන්ට උපදෙස්**

**පියවර 01-** 9 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව පෙළපොතේ පිටු අංක 59 – 61 දක්වා හොදින් කියවා ගන්න.

**පියවර -02** පෙර උපදෙස් පරිදි ප්‍රශ්ණාවලිය සදහා පිළිතුරු සපයන්න

**ප්‍රශ්ණාවලිය**

(1)වෙරළබඩ කලාපයට පොදු වූ මානුෂ ක්‍රියාකාරකම් 4 ක් ලියන්න.

(2) ඔබ සදහන් කළ මානුෂ ක්‍රියාකාරකම් සදහා වෙරළ කලාපයේ ඇති භෞතික පහසුකම් මොනවාදැයි සදහන් කරන්න.

(3)තෙත් කලාපීය භූ දර්ශනය තුල සිදුවන මානුෂ ක්‍රියාකාරකම් 4ක් ලියන්න.

(4)මෙම ප්‍රදේශයේ වැවෙන බෝග වර්ග කිහිපයක් නම්කර එම එක් එක් බෝග වර්ගය සදහා බලපා ඇති භෞතික සාධක මොනවාදැයි ලියන්න.

(5)මෙම ප්‍රදේශය ජනාධිකවීමට බලපා ඇති භෞතික සාධක මොනවාද?

(6)වියළි කලාපීය භූ දර්ශනයේ කැපී පෙනෙන අංශය කුමක්ද?

(7)වියළි කලාපය තුළ වී වගාව දියුණුවීමට බලපා ඇති ප්‍රධාන භෞතික සාධක 2 ක් නම් කරන්න

(8)වියළි කලාපීය භූ දර්ශනය තුළ කැපී පෙනෙන මානුෂ ක්‍රියාකාරකම් මොනවාද?

**පසු වැඩ :** විවිධ භූ දර්ශන තුළ හදුනාගතහැකි මානුෂ ක්‍රියාකාරකම් දැක්වෙන පින්තූර ගොනුවක් සකස් කරන්න. එක් එක් භූ දර්ශනය සදහා වෙන වෙනම පිටු වෙන් කරන්න.මෙම ක්‍රියාකාරකම පාසල ආරම්භ වූ පසු ඔබගේ විෂයභාර ගුරුභවතා වෙත ලබා දීමට කටයුතු කරන්න.

සැකසුම: එම් .බී. නදීකා දිල්හානි මිය. ර/නිවි/කෙහෙල්ඔවිටිගම විදුහල